Australian Government

Department of Immigration and Border Protection

# මිනිස් ජාවාරමට එරෙහිව කටයුතු කිරීම සඳහාවූ ප්‍රධාන මාර්ගය අධ්‍යාපනයයි

ඕස්ට්‍රේලියාවේ ශක්තිමත් දේශසීමා ආරක්ෂණ ප්‍රතිපත්ති සහ හැකියාවන් මගින් සනාථකර ඇත්තේ නීතිවිරෝධී ලෙස ඕස්ට්‍රේලියාවට බෝට්ටුවෙන් පැමිණෙන ජාවාරම් වැළැක්වීමට එය ඉතා ඵලදායී බවයි.

ඕස්ට්‍රේලියානු ස්වාධිපත්‍ය දේශසීමා මෙහෙයුමේ (Operation Sovereign Borders (OSB)) අණදෙන නිලධාරී එයාර් වයිස් මාර්ෂල් (Air Vice-Marshal) Stephen Osborne පවසන ආකාරයට, ඕස්ට්‍රේලියාව වෙත නීතිවිරෝධී ආකාරයට සංක්‍රමණයවීමට උත්සාහ ගන්නා අය වැළැක්වීමෙහිලා අධ්‍යාපනය වැදගත් කාර්යභාරයක් ඉටු කරයි.

“Operation Sovereign Borders හි අරමුණුවලින් එකක් වන්නේ වෙනත් රටවල සිටින ගොදුරට ලක්විය හැකි අය හට ඕස්ට්‍රේලියාව වෙත නීතිවිරෝධී ආකාරයට බෝට්ටුවෙන් පැමිණීමට උත්සාහ ගැනීමේ ඇති දරුණු අවදානම සහ ඵලවිපාක සම්බන්ධයෙන් ඉගැන්වීමවේ.

“මිනිසුන් ඕස්ට්‍රේලියාවේ දේශසීමා ආරක්ෂණ ප්‍රතිපත්ති සම්බන්ධ කරුණු නොදන්නේ නම්, ඔවුන් වැරදි තීරණයක් ගෙන ඕස්ට්‍රේලියාව වෙත බෝට්ටුවෙන් පැමිණීමට උත්සාහ කිරීමට ඉඩප්‍රස්ථාව ඇත.

Air Vice-Marshall Osborne පැහැදිලි කලේ ජීවිත ආරක්ෂා කර ගැනීම සහ ඕස්ට්‍රේලියානු දේශසීමාව ආරක්ෂා කිරීම සම්බන්ධයෙන් ඕස්ට්‍රේලියානු ප්‍රජාව හට වැදගත් කාර්යභාරයක් ඉටුකල හැකි බවයි.

“අපගේ පර්යේෂණ මගින් පෙන්වා දෙන්නේ විදේශවල සිටින අයගේ සංක්‍රමණ තීරණවලට බලපෑම් සිදු කිරීම සම්බන්ධයෙන් ඕස්ට්‍රේලියාවේ බහුසංස්කෘතික ප්‍රජාව මගින් සැලකිය යුතු කාර්යභාරයක් ඉටු කරන බවයි.

“මෙම හේතුව නිසා, ඕස්ට්‍රේලියානු දේශසීමා ආරක්ෂණ ප්‍රතිපත්ති සම්බන්ධ අවබෝධය වැඩි කිරීමට සහ ප්‍රජා සාමාජිකයන් හට සිය රටවල සිටින හිතමිතුරන් සහ පවුලේ අය සමග මෙම දැනුම බෙදාහදා ගැනීමට උනන්දු කිරීමට අප මෙම ප්‍රජාවන් සමග කටයුතු කිරීමට ඇපකැපවී සිටී.

“තමන් විශ්වාස කරන මිතුරෙකු හෝ ඥාතියෙකු ඔස්සේ තොරතුරු පැමිණෙන විට එම තොරතුරු විශ්වාස කිරීමට වැඩි ඉඩකඩ ඇති අතර, එතෙර සිටින අයගේ තීරණවලට බලපෑම් සිදු කිරීමේදී මෙම අය හට එම තීරණවල විශාල වෙනසක් සිදුකල හැකිය,” ඔහු පැවසීය.

ඕස්ට්‍රේලියාව වෙත සිදුවන නීතිවිරෝධී සංක්‍රමණය වැළැක්වීම සම්බන්ධයෙන් OSB හට ප්‍රබල වාර්තාවක් තිබුණු පමණට, අපට ඒ සම්බන්ධයෙන් සෑහීමකට පත්විය නොහැකි බවට Air Vice-Marshal Osborne විසින් අනතුරු හඟවන ලදී.

“අපගේ දේශසීමා ආරක්ෂණ ප්‍රතිපත්ති සම්බන්ධ වෙනස්වීම් හෝ ඕස්ට්‍රේලියාව වෙත පැමිණීමට ඇති වෙනත් මාර්ග සම්බන්ධයෙන් මිනිස් ජාවාරම්කරුවන් විසින් සක්‍රීය ලෙස දූෂමාන ආරංචි පැතිරීම සහ සාවද්‍ය තොරතුරු ලබාදීම සිදු කරනු ඇත.

“එමනිසා අප විසින් ඉදිරිපත්වී සත්‍ය පවසා, මිනිස් ජාවාරම් කරුවන්ගේ බොරුවලට එරෙහිව කටයුතු කිරීම ඉතා වැදගත්වේ.

“සිය දේශසීමා ආරක්ෂණ ප්‍රතිපත්ති වෙනස් නොවන බවට ඕස්ට්‍රේලියානු රජයේ ප්‍රතිපත්තිය පැහැදිලිය.

“ඕස්ට්‍රේලියාවට නීතිවිරෝධීව බෝට්ටුවෙන් පැමිණීමට උත්සාහ කරන ඕනෑම අයෙකුව හරවා යවනු ඇත,” යනුවෙන් ඔහු පැවසීය.

Air Vice-Marshal Osborne විසින් ඕස්ට්‍රේලියානු බහුසංස්කෘතික ප්‍රජාවන්ගෙන් ඉල්ලා සිටින්නේ ඕස්ට්‍රේලියාවේ දැඩි දේශසීමා ආරක්ෂණ ප්‍රතිපත්ති සම්බන්ධයෙන් එතෙර සිටින සිය පවුලේ අය සහ හිතමිතුරන් සමග කථාබහ කරන ලෙසයි.

“මිනිස් ජාවාරම්කරුවන් විසින් ගොදුරු විය හැකි අයව රවටා ඔවුන්ගේ ජීවිත අවදානමට තැබීමෙන් ඔවුන්ව ආරක්ෂා කර ගැනීමට ඕස්ට්‍රේලියානු බහුසංස්කෘතික ප්‍රජා මගින් අප වෙත උපකාර ලබාදීම ඉතා වැදගත්වේ.

“ඔබ ඔබගේ හිතමිතුරන් සහ පවුලේ අය සමග කථාබහ කරන විට ඕස්ට්‍රේලියාවට පැමිණීමට ඇති එකම ක්‍රමය වලංගු වීසා බලපත්‍රයක් ඇතිව පමණක්ය යන වග ඔවුනට පවසන්න. මිනිස් ජාවාරම්කරුවෙකු විශ්වාස කර බෝට්ටුවකට නැගී සිය මුදල් නැති නාස්ති කර ගැනීම හෝ සිය ජීවත අවදානමේ තැබීම සිදු නොකරන ලෙස ඔවුනට කියා දෙන්න.

“ඕස්ට්‍රේලියාව වෙත ඇති නීතිවිරෝධී ලෙස මුහුදින් පැමිණීමේ මාර්ගය වසා ඇත, එමෙන්ම එය එසේම වසා තබනු ඇත,” යනුවෙන් ඔහු පැවසීය.

OSB සම්බන්ධ වැඩිදුර විස්තර සඳහා, කරුණාකර www.australia.gov.au/novisa වෙබ් අඩවිය වෙත පිවිසෙන්න.